# චීන මළවුන් පිදීමේ උලෙළෙහි බෞද්ධාභාසය පිළිබඳ අධ්‍යයනයක්

පූජ්‍ය නාඹටුන්නේ විමලඤාණ හිමි
පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

## ABSTRACT

මළවුන් පිදීම සහ පුණ්‍යානුමෝදනාව ආදි බෞද්ධ මූලාශ්‍රයන්ගෙන් නිර්දේශිත සදාචාර ධර්මයකි. මියගිය ඥාතීන් සිහිකිරීම සහ පුණ්‍යානුමෝදනාව ජීවත්ව සිටින ඥාතීන්ගේ යුතුකමක්, වගකීමක් මෙන් ම කෙළෙහිගුණ දැක්වීමේ සත්චාරිත්‍රයක් බව බුදුදහම පෙන්වා දෙයි. පිං අපේක්ෂාවෙන් සිටින මියගිය ඥාතීන් ඒ බව විවිධ සංඥා මගින් සිය ඥාතීන්ට දැනුම් දෙන අයුරුත් පුණ්‍යානුමෝදනාවෙන් සතුටු වන අයුරුත් ඛුද්දකනිකායේ පෙතවත්ථුවේ දැක්වේ. සැරියුත් තෙරුන් වහන්සේගේ පෙර භවයක මෑණියන් සාගිනි ප්‍රේතියක් ව ඉපිද පිං අපේක්ෂාවෙන් ඒ බව තෙරුන් වහන්සේට දැනුම් දීමෙන් පසු බුදුන් වහන්සේගේ උපදෙස් පිට ඇයට පුණ්‍යානුමෝදනා කළ අයුරුත් එමගින් ඇය සැපවත් භවයක් ලැබූ අයුරුත් පෙතවත්ථුවේ විස්තර වේ. මෙම කථාපුවතත් නිධිකණ්ඩ සහ තිරොකුඩ්ඩ යන සූත්‍ර අන්තර්ගතයත් පසුකලෙක රචිත මහායාන උල්ලම්භන සූත්‍රයට පසුබිම් වී ඇත. පාලි මූලාශ්‍රයාගත තොරතුරු සහ මහායාන සූත්‍රය අතර අසමානතා බහුල වුව ද එමගින් පුණ්‍යානුමෝදනා සංකල්පයෙහි විචිත්‍රවත් නවීකරණය සනිටුහන් කරයි.

මහායාන උල්ලම්භන සූත්‍රය චීනයට හඳුන්වා දීමේ දී සංස්කරණ කිහිපයක් සිදුවිය. එහි ප්‍රතිඵලය වූයේ පැරණි සංස්කෘත සූත්‍රයේ සමහර කරුණු සාම්ප්‍රදායික චීන සංස්කෘතියට සාපේක්ෂව සංස්කරණය වීමයි. කල්යත්ම චීන ජාතිකයන්ගේ ඉපැරණි ඇදහිලි හා විශ්වාස සමඟ මෙන් ම තාඕ ආගමික ඉගැන්වීම් සමඟ ද මිශ්‍ර වූ උල්ලම්භන සූත්‍රයෙහි අන්තර්ගතය චීන මළවුන් පිදීමේ උලෙළ දක්වා විකාශය විය. වර්තමාන චීන මළවුන් පිදීමේ උලෙළ නවාංග රසකින් සමන්විත විචිත්‍ර සංස්කෘතික සන්දර්ශනයක ස්වරූපයක් උසුලයි. චීන මළවුන් පිදීමේ උලෙළ මහායාන බුදුසමය ව්‍යාප්ත ජපානය, කොරියාව, තායිවානය, මැලේසියාව, වියට්නාමය සහ ඉන්දුනීසියාව වැනි රටවල් දක්වා ද ව්‍යාප්ත වී ඇත. ඒ සෑම රටක ම ඔවුනට ආවේණික ඉපැරණි ඇදහිලි හා විශ්වාස සමඟ බෞද්ධ සංකල්ප සම්මිශ්‍රණය කර ගැනීම දක්නට ලැබේ. මළවුන්ට ආහාරපාන, වස්ත්‍රාභරණ සහ මිලමුදලින් සංග්‍රහ කිරීමත් සන්දර්ශන පවත්වා ඔවුන් සතුටු කිරීමත් මේ රටවල දක්නට ලැබෙන මළවුන් පිදීමේ උලෙළ විචිත්‍රවත් කිරීමට හේතු වී ඇත. මෙම උලෙළ කෙතරම් සංකීර්ණ වුවද එහි සෑම අංගයකින් ම මූලික ආදි බෞද්ධ සංකල්පය වන මළවුනට ආදරයෙන්, කරුණාවෙන් සැළකීම හා ගෞරව කිරීම ප්‍රකට වේ.